


# පස්වන සැසිය

## රෝගියාගේ මානසික, සාමාජීය සහ ආර්ථික ගැටළු හඳුනා ගනිමු

# රෝගියාගේ මානසික සෞඛ්‍යය ගැන සැලකිලිමත් වෙමු

- ජීවිතයට තර්ජනයක් වියහැකි පිළිකාව, වකුගඩු අකර්මණ්‍ය වීම වැනි රෝගාබාධයක් වැළඳී ඇතැයි දැනගැනීම එම පුද්ගලයාට සහ පවුලේ සාමාජිකයන්ට අදහාගත නොහැකි දෙයක් වනු ඇත. ඇතැමෙකුට තම ජීවිතය උඩු යටිකුරු වී ඇතැයි සිතීමට ද පුළුවන.
- එවන් තැනැත්තෙකුගේ බිය හා සාංකාව දුරුවන පරිදි කටයුතු කිරීම සඳහා රැකබලාගන්නා ලෙස ඔබට විශාල කාර්යභාරයක් ඉටුකිරීමට හැකියාව ඇත.

# පිළිකා රෝගය හඳුනාගත් පසු රෝගියෙකු මුහුණදෙන මානසික වෙනස්කම් වල අවස්ථා

1. **රෝග නිශ්චය ප්‍රතික්ෂේප කිරීම - Denial Phase (First Stage)**

- කුමන තත්ත්වයේ පිළිකාවක් වුවද රෝග නිශ්චය ප්‍රතික්ෂේප කිරීමට රෝගියා පෙළඹීම ස්වාභාවිකයි.
- රෝග නිශ්චයත් සමඟම ජීවිතය පිළිබඳව බියට පත්වීමත් ප්‍රතිකාර වලට ඉක්මනින්ම අනුගත වීමට සිදුවීමත් නිසා මෙම රෝග නිශ්චය ප්‍රතික්ෂේප කිරීමේ අවදිය ඇතිවිය හැකිය.

## 2. තරහව - Anger (Second Stage)

- ප්‍රතිකාරවල ආරම්භයත් සමඟම එයින් ඇතිවන වේදනාව ද මෙම කාලයේදී දැකිය හැකිය.
- දුක සහ වේදනාව ද දැකිය හැකිය.
- වේදනාව යම්තාක් දුරකට දුරුවීමත් සමඟම තරහව වඩාත් උත්සන්න වෙයි.
- මෙම තරහව පිළිකා රෝගී තත්වයට අදාල හෝ අදාල නොවිය හැකි අතරම තමා අවට ඇති සියලු දේ කෙරෙහිම එල්ල විය හැකිය.

# 3. කේවෙල් කිරීමේ අවදිය Bargaining stage (Third stage)

- මෙම අවදියේදී රෝගියා තමාට කළහැකි සියලුම දේ කිරීමට පෙළෙඹෙයි.
- මෙම අවස්ථාව රැකබලාගන්නා හොඳින් තේරුම් ගත යුතුය.
- කේවෙල් කිරීමට තවදුරටත් දෙයක් නොමැතිවිට රෝගියාගේ මානසික දුක්ඛරගතිය ඉතා ප්‍රබල විය හැකිය.
- විශාදය තත්ත්වය දක්වා ද ගමන් කළහැකිය.

## 3. මානසික අවපීඩනය (Depression)

- ජීවිතයේ වෙනස්කම් ඇතිවනවිට මනසික අවපීඩන තත්ත්වයක් ද ඇතිවිය හැකිය.
- දැඩි ශෝකී ස්වභාවයක් පෙන්විය හැකිය.

## 4. යථාතත්ත්වය තේරුම් ගැනීමේ අවදිය (Acceptance Stage)

- මෙහිදී රෝගියා තමාගේ රෝගී තත්ත්වය තේරුම් ගනියි.
- මෙය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්විය හැකිය.

# රෝගියෙකු මුහුණදෙන මානසික ආතතිය (Psychological Stress)

- ´නෑම පුද්ගලයෙකු ශාරීරික සහ මානසික පීඩාවකට පත්ව සිටින විට එම පුද්ගලයාගේ ශරීරය එයට වැඩි ශක්තියකින් මුහුණ දීම සඳහා විවිධාකාරයෙන් සූදානම් වෙයි.
- උදාහරණ ලෙස හෘද ස්පන්දන වේගය වැඩිවීම, රුධිර පීඩනය වැඩිවීම, රුධිරයේ සීනි ප්‍රමාණය වැඩිවීම දැක්විය හැකිය.
- කාලයක් මෙම මානසික පීඩන තත්ත්වය පවතින විට සහ එම මානසික පීඩනය එම පුද්ගලයාට දරාගත නොහැකි මට්ටමක පවතිනවිට මානසික අවපීඩන තත්ත්වයක් (Psychological distress) දක්වා වර්ධනය විය හැකිය.

# මානසික අවපීඩන තත්ත්වය (Psychological distress)

- මානසික අවපීඩන තත්ත්වයකදී එම පුද්ගලයා තමාට හානිදායක වන සහ සාමාන්‍ය නොවන ශාරීරික සහ මානසික ලක්ෂණ පෙන්නුම් කරයි.
- ශාරීරිකව පෙන්නුම් කරන ලක්ෂණ වලට උදාහරණ ලෙස නින්ද නොයාම, කෑම අරුචිය, කාන්තාවන්ගේ ඇතිවන ඔසප් වීමේ ක්‍රියාවලිය අක්‍රමවත් වීම, හිසරදය, දිගටම පවතින ශාරීරික වේදනාවන් සහ අධික මහන්සිය දැක්විය හැකිය.
- මානසිකව ඇතිවන ලක්ෂණ වලට උදාහරණ ලෙස තරහව පාලනය කරගැනීමට ඇති අපහසුතාවය, සමාජය තුල හැසිරීමේදී ඇති දුර්වලතා (Changes in social behaviour), මානසික මට්ටම නිතර වෙනස් වීම (mood swings) වැනි ලක්ෂණ දැක්විය හැකිය.

# මානසික ආතතිය (Psychological stress) සහ මානසික අවපීඩන තත්ත්වය (Psychological distress) පාලනය කරගැනීම.

- රෝගියා රැකබලා ගැනීමෙහි නිරතවන පුද්ගලයෙකුට එම රෝගී වූ පුද්ගලයා පසුවන මානසික ආතතිය අඩුකර ගැනීම සඳහා උපකාර කළ හැකිය. ඒ සඳහා අවශ්‍ය දැනුම එම රෝගියාට ප්‍රතිකාර කරන වෛද්‍ය කාර්ය මණ්ඩලයෙන් හෝ රෝහල් වල ඇති මානසික ප්‍රතිකාර ඒකකයෙන් ලබා ගත හැකිය.
- උදාහරණ ලෙස ඔහු හෝ ඇය ප්‍රිය කරන ක්‍රියාවලියක නිරතවීම (ව්‍යායාම කිරීම, සංගීතය ශ්‍රවනය, චිත්‍ර ඇඳීම, භාවනා කිරීම, ගෙවත්තේ ක්‍රියාකාරකමක නිරත වීම, යෝග භාවනා කිරීම ආදිය දැක්විය හැකිය).
- අවශ්‍යනම් රෝගියාට මානසික උපදේශකවරයෙකු සමඟ තම ගැටළු පිළිබඳව කතා කිරීමට සැලැස්විය හැකිය.

- රෝගය සහ ප්‍රතිකාර පිළිබඳව දැනුම්වත් කරන වැඩසටහන් වලට රෝගියා, රැකබලාගන්නා සහ එම පවුලේ සාමාජිකයන් සහභාගි කරවීමෙන් ඔවුන් තුල ඇති මානසික පීඩනය අවම කරගත හැකිය.
- උදාහරණ ලෙස පිළිකා රෝගීන් එකතු වී සාදා ගත් කණ්ඩායම් වලට රෝගියා සහ රැකබලාගන්නා සහභාගි වීමෙන් ඔවුන්ගේ ඇති අත්දැකීම් බෙදා ගත හැකිය. මෙය මානසික පීඩනය අවම කර ගැනීමට විශාල පිටුවහලක් වනු ඇත. ඇතැම් අවස්ථාවන් වල මෙවැනි කණ්ඩායම් රෝගියා ප්‍රතිකාර ලබාගන්නා රෝහල තුලම පවතියි.

# රෝගී වූ ආදරණීයයා රැකබලා ගැනීමේදී......

- මානසික අවපීඩන තත්ත්වය (Psychological distress) මුල් අවස්ථාවේදීම හදුනා ගැනීම ඉතා වැදගත් වන අතර එය පාලනය කර නොගතහොත් විශාදය, කාංසාව වැනි මානසික රෝග තත්ත්වයන් දක්වා වර්ධනය විය හැකි බව මතක තබා ගැනීම වැදගත් වෙයි.
- සමහර අවස්ථාවලදී විශාදයෙන් (Depression) පෙළෙන පුද්ගලයෙකුට කාංසාව (Anxiety) ද ඇති විය හැකි බව මතක තබා ගන්න.

# රැකබලාගන්නාට රෝගියා වෙනුවෙන් කළහැකි දේ

- රෝගී වූ පුද්ගලයාගේ මානසික තත්ත්වය ගෙන ඒ අනුව කටයුතු කිරීම.
- රෝගියාගේ හැඟීම් පිළිබඳව වෛද්‍යවරයා සමඟ විවෘතව කතාබහ කිරීමෙන් ඔහු/ඇය තුල පවතින මානසික පීඩනය, දුක හා කණගාටුව ආදී සිතුවිලි පාලනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාගැනීම්
- මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර (Psychological treatment) සහ උපදේශන (Counselling) සේවා, තම අවශ්‍යතාවයට අනුකූලව රෝගියාට ලබාදීමට කටයුතු කිරීම.

# රෝගියාට අවශ්‍ය උපදේශන සේවා ලබාගතහැකි ස්ථාන

- ප්‍රතිකාර ලබන පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථානයට අනුබද්ධව කටයුතු කරන මානසික උපදාශකවරුන්
- රජයේ රෝහල්වල මානසික ප්‍රතිකාර සායනවලට අනුබද්ධව කටයුතුකරන මානසික උපදේශකවරුන්
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුබද්ධව කටයුතුකරන මානසික උපදේශකවරුන්

# පිළිකා රෝගය සෑදුණු රෝගීන් එකතු වී සාදාගත් කණ්ඩායම් (Self – help groups)

- මෙවැනි කණ්ඩායම් ඇත්නම් ඒවාට හවුල් වීමට ද රෝගියාව යොමු කිරීමෙන් හා පිළිකාවෙන් සුව වූවන්ගෙන් සැදුම් ලත් කණ්ඩායම් වල සහාය හා ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට ද සැලැස්වීමෙන්

(උදා: මිතුරුවැල සහායක ජාලය) රෝගියාගේ ජීවිතය පිළිබඳ සුබවාදී ආකල්ප වර්ධනය කරගත හැකිය.

- දුක සහ කණගාටුව මෙන්ම මානසික පීඩනය දිගු කාලයක් පවතී නම් හා එය එම පුද්ගලයාගේ එදිනෙදා කටයුතු වලට බාධාවක් වේ නම්,
- ඔහුට/ඇයට විශාදය (Depression) නැමැති රෝග තත්ත්වය දක්වා එය වර්ධනය විය හැකි බව ද රැකබලාගන්නා මතක තබා ගත යුතුය.

# විශාදය (Depression)

- විශාදය ( Depression ) නැමැති රෝගී තත්ත්වය රෝගියාට විශාල මානසික පීඩාවක් ඇති කරයි.
- විශාදය (Depression), පහත රෝග ලක්ෂණ අනුව හඳුනා ගත හැකිය.

# විශාදයේ රෝගලක්ෂණ

- දිගටම පවතින දුක්බර මානසික තත්වය
- සිතේ ඇති නුරුස්නා ස්වභාවය
- සියලුම ක්‍රියාකාරකම් සඳහා දක්වන අකමැත්ත
- අසාමාන්‍ය ලෙස ඇඟ කෙට්ටුවීම හෝ මහත් වීම
- වැඩක් පටන් ගැනීමට හෝ දිගටම කරගෙන යාමට ඇති අකමැත්ත
- අසාමාන්‍ය ලෙස දැනෙන මහන්සිය

- කලින් කැමැත්තෙන් කළ ක්‍රියාකාරකම් වලට තිබෙන කැමැත්ත අඩු වීම.
- නින්ද අඩුවීම/නින්ද නොයාම හෝ අධික ලෙස නින්ද යාම.
- අවධානය අඩුවීම/මතක ශක්තිය අඩුවීම හෝ තීරණ ගැනීමේ ඇති දුර්වල බව.
- තමා වැඩකට නැති පුද්ගලයෙකු යැයි සිතීම/දැඩි අසරණ බවක් දැනීම.
- නිතර නිතර ඇතිවන සියදිවි හානි කරගැනීමේ සිතුවිලි, ඒ සඳහා සූදානම් වීම.

- ඉහත සඳහන් රෝග ලක්ෂණ අතරින් ශරීරය කෙට්ටු වීම, මහන්සිය හා අමතක වන සුළු ස්වභාවය පිළිකාව සඳහා සිදුකෙරෙන ප්‍රතිකාර නිසාත් ඇතිවීමට පුළුවන් බව මතක තබා ගත යුතුය.
- නමුත් ඉහත සඳහන් රෝග ලක්ෂණ අතරින් කිහිපයක් පැවතිය හොත් එය විශාදය යැයි සැක කළ හැකිය.
- එසේ වුවහොත් රෝගී වූ ආදරණීයයා පළපුරුදු මානසික රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු ලවා පරීක්ෂා කරගත යුතුය.
- ඔහු/ඇය තමාට හානිකර ගැනීමට උත්සාහ දරා ඇත්නම් වෛද්‍ය උපදෙස් ඉතා කඩිනමින් ලබා ගැනීමට සැළකිලිමත් විය යුතුය.

# විෂාදයෙන් පෙළෙන රෝගියා වෙනුවෙන් රැකබලා ගන්නාට කළහැකි දේ.......

- ඔහුව/ඇයව, මානසික ප්‍රතිකාර රෝග ලක්ෂණ පහව යනතෙක් නොකඩවා ලබාගැනීමට උනන්දු කරන්න.
- රෝගී වූ පුද්ගලයා තනිවී නොමැති බව ඔහුට/ඇයට ඒත්තු ගන්වන්න.
- ඔහු/ඇයගේ පිළිකා රෝගය පිළිබඳ තොරතුරු හා ඇති වෙනත් ගැටළු වලට සවන් දී ඔහු/ඇය තනි වී නොමැති බව දැනෙන්නට හරින්න.
- වෙනදා රෝගී වූ පුද්ගලයා තනිවම සිදු කළ ක්‍රියාකාරකම් (උදා: රැවුල බෑම, මුහුණ සේදීම ආදිය) කරගෙන යාමට උනන්දු කරන්න.

- රෝගී වූ හිතවතාව ඔහු/ඇය ප්‍රියකරන ක්‍රියාකාරකම් වල යෙදීමට හා පුද්ගලයන් සමඟ ප්‍රියජනක කථාබහ වල නිරත වීමට උනන්දු කරන්න.
- ශාරීරික ක්‍රියාකාරකම්, ව්‍යායාම (උදා: දිනපතා ඇවිදින්නට යාම) වැනි දේ සඳහා උනන්දු කරන්න.
- අවශ්‍ය විට මානසික ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෛද්‍යවරයා හමුවට යාමට අවස්ථාව සලසා දෙන්න.
- ප්‍රතිකාර ලබාගැනීමෙන් කාලයත් සමඟ රෝගය සුව වන බවට හෝ පාලනය වන බවට රෝගියා තුළ විශ්වාසය ගොඩ නැන්වීමට කටයුතු කරන්න.

# විශාදයෙන් වැලකීම සඳහා......

- ජීවිතයේ ඕනෑම අවස්ථාවක විශාදය හෝ වෙනත් මානසික රෝගී තත්ත්වයක් සෑදීම ඉතාමත්ම සුලභ හා සාමාන්‍ය සිදුවීමක් බව රැකබලා ගන්නා ලෙස ඔබ හොඳින් වටහා ගැනීම ඉතා වැදගත් වන අතර ඒ බව රෝගී වූ ආදරණීයයාට ද වටහා දීමට උනන්දු වන්න.

- තම හැඟීම් තමා තුළම තබා නොගෙන පිටකිරීමට රෝගී වූ පුද්ගලයාව උනන්දු කරන්න.
- උදා: වෙනත් විශ්වාසවන්ත පුද්ගලයෙකු සමග කතාබහ කිරීමෙන්, සිතුවිලි පිළිබඳව ලිවීමෙන්
- දුක්ඛර සිදුවීම් ගැන තමාටම දොස් පවරා නොගෙන සිටීමට උනන්දු කරන්න.
- රොගී වූ පුද්ගලයා ප්‍රිය කරන කටයුතු දිගටම කරගෙන යාමට ද ඔබ රැකබලා ගන්නා ලෙස, ඔහු/ඇයව උනන්දු කරන්න.

# කාංසාව (Anxiety)

- කාංසාව යනු බිය හා තැති ගැනුණු ස්වභාවයයි
- කාංසාවේ රෝගලක්ෂණ

➢ රෝගියාට නිතර දහඩිය දැමීම
➢ නොඉවසිලිමත් බව
➢ කළබලකාරී බව
➢ වෙවුළනසුළු බව
➢ තොල් හා මුඛයේ වියළි ස්වභාවය
➢ කඩින් කඩ ඇති වන පපුවේ තද ගැස්ම
➢ අධික බිය

# මෙවැනි ස්වභාවයක් ඇති වූ විට රැකබලාගන්නා ලෙස ඔබ.....

- ඒ බව තහවුරු කරගෙන රෝගියා සමඟ සන්සුන්ව හා මෘදුව කතාබහ කළයුතුය.
- වෛද්‍ය කාර්ය මණ්ඩලය දැනුවත් කර අවශ්‍ය උපදෙස් හා ප්‍රතිකාර ලබා ගැනීමෙන් රෝගියාගේ මානසික සෞඛ්‍යය යහපත්ව පවත්වා ගැනීමට ඔබට උදව් කළ හැකිය.

## රෝගී වූ පුද්ගලයා විශාදය, කාංසාව වැනි මානසික රෝග තත්ත්වයකින් දැනටමත් පසුවන්නේනම්...

- මානසික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකු යටතේ ක්‍රියාත්මක වන මානසික ප්‍රතිකාර ඒකකයකින් ප්‍රතිකාර ලබාගැනීමට සැලකිලිමත් වන්න.
- රෝගියා එම ප්‍රතිකාර නොකඩවා ලබාගන්නේද යන්න පිළිබඳවත් සැලකිලිමත් වන්න
- සාමාන්‍යයෙන් මානසික රෝගයක් සඳහා ලබාදෙන ප්‍රතිකාර දිගු කාලයක් ලබාගත යුතු අතර එම ප්‍රතිකාර ලබාගැනීම නවත්වන්නේනම් මානසික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අනු දැනුම යටතේ පමණක් සිදුකරන්න

# සිද්ධි අධ්‍යයනය 1

සුනේත්‍රා විවාහක පනස් වියැති ගුරුවරියක් වන අතර ඇය විවාහ වී සිටින්නේ ද ගුරුවරයෙකු සමඟයි. ඔවුන්ට දරුවන් නොමැත. ඔවුන් පදිංචිව සිටින්නේ ගම්පහ ප්‍රදේශයේය. ගුද මාර්ගය ආශ්‍රිත පිළිකාව සොයාගන්නා අවස්ථාව වනවිට එය අදියර තුන (Stage 3) අවධියෙහි පැවති අතර ඇයව විකිරණ ප්‍රතිකාර, ඖෂධ ප්‍රතිකාර සහ සැත්කම් සඳහා නිතර නිතර රෝහල් ගත කිරීමට සිදුවුණි. ඇයට දරුවන් සහ සහෝදර සහෝදරියන් නොසිටි නිසා රැකබලා ගැනීමේ කටයුතු සිදුකිරීමට සිදුවූයේ ඇයගේ ස්වාමි පුරුෂයාටයි.

ගුද මාර්ගයේ පිළිකාව සොයා ගැනීමෙන් පසු ඇය දැඩි මානසික පීඩනයකින් පසුවූ අතර ක්‍රම ක්‍රමයෙන් ප්‍රතිකාර ප්‍රතික්ෂේප කිරීමට ද පෙළඹුණි. ස්වාමියා ඇය වෙනුවෙන් මහන්සි වීම ද ඇයට දරාගත නොහැකි පීඩාවක් ගෙනදුණි.

නිතර නිතර සුනේත්‍රා සියදිවි හානිකර ගැනීම ගැන පවසන අතර ඇයගේ මානසික සෞඛ්‍යය යහපත්ව පවත්වා ගන්නා ආකාරය සාකච්ඡා කරන්න.

# රෝගියෙකු මුහුණදෙන සාමාජීය සහ ආර්ථික ගැටළු හඳුනාගනිමු.

1. රැකියාව සහ ආදායම් මාර්ගය අහිමිවී යාම

2. දරුවන් රැකබලාගැනීමේ දුෂ්කරතා

3. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම

4. බෙහෙත් සහ ගමන් වියදම් සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම

5. රෝහල අසලින් නවාතැන් පහසුකම් ලබාගැනීමට ඇති දුෂ්කරතා

6. ප්‍රතිකාර නිසා ඇතිවන අතුරු ආබාධ

(උදා: කොණ්ඩය යාම වැනි) වලින් සමාජය ඉදිරියට යාමේදී ඇතිවන අපහසුතා

# ආර්ථික ගැටළු වළක්වා ගැනීම/පාලනය සඳහා

- අවශ්‍ය නම් උදව් කල හැකි ඥාතීන් හා හිතමිත්‍රයන්ගෙන් උදව් ලබාගත හැකිය.
- රජයෙන්, සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා ලබාදෙන සහනාධාර පිළිබඳව ග්‍රාම සේවා නිලධාරී මහත්ම මහත්මීන්ගෙන් අසා දැනගත හැකිය.
- සහන සත්කාර සේවා සපයන ස්වේච්ඡා ආයතන වල සහාය ලබාගත හැකිය.

# රැකියාව / ආදායම් පවත්වා ගැනීම සඳහා

- රැකියා ස්ථානයට රෝග තත්ත්වය පිළිබඳ ලිඛිත තොරතුරු සපයා සහනයක් ලබාගැනීමට උනන්දු වන්න.
- රෝගී වූ ආදරණීයයාට ස්වයං රැකියාවක නිරත වීමට හැකියාව පවතී නම් ඒ සඳහා අනුබල දෙන්න.
- ගෘහාශ්‍රිත ව්‍යාපාර කිරීමට රාජ්‍ය/රාජ්‍ය නොවන සංවිධාන වල සහාය ලබා ගැනීමට උනන්දු වන්න.

# පිළිකා රෝගීන්ගේ සාමාජීය සහ ආර්ථික ගැටළු වලට සහනය ලබාදීම සඳහා රජයේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ දායකත්වය

## 1. ග්‍රාම නිලධාරි

- අනෙකුත් රජයේ නිලධාරින්, සේවා අවශ්‍යතාවය මත සම්බන්ධීකරණය කිරීමේ හැකියාව ඇත.

## 2. ආර්ථික සංවර්ධන නිලධාරි

- රජයේ සංවර්ධන වැඩසටහන් ගම්මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.
- ගමේ ජනතාවගේ අවශ්‍යතා හඳුනාගෙන සංවර්ධන වැඩසටහන් හා සහන සත්කාර සේවා ගම් මට්ටමෙන් සංවිධානය කිරීමේ හැකියාව ඇත.

## 3. දිවි නැගුම සංවර්ධන නිලධාරි

- ගම් මට්ටමේදී සහනාධාර හා රක්ෂණ ප්‍රතිලාභ අවශ්‍ය පවුල් හඳුනා ගැනීම සිදු කරනු ලබයි.
- පිළිකා රෝගීන්ගේ පවුල් සඳහා මෙම සහනාධාර ලබා දිම කඩිනම් කිරීම.
- පිළිකා රෝගීන් සඳහා නිවාස ආධාර වැඩසටහන් වලදී ප්‍රමුඛත්වයක් ලබා දීම.
- පාසල් ළමුන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීමේ වැඩසටහන් වලදී ප්‍රමුඛතාවය ලබා දීම.

# ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිය කාර්යාලය පවත්වා ගෙනයන ක්ෂේත්‍ර නිලධාරින්

## 1. සමාජ සේවා නිලධාරි

- රජයේ බොහෝ සහනාධාර දීමනා වැඩසටහන් ක්ෂේත්‍රයේදී සම්බන්ධීකරණය කරනු ලබන්නේ මෙම නිලධාරින් මඟිනි.

➢ ක්ෂේත්‍රයේදී රෝගීන් හඳුනා ගැනීම.

➢ රෝගියාගේ හා පවුලේ උදවියගේ අවශ්‍යතා හඳුනා ගැනීම.

➢ අවශ්‍යතා ඇති රෝගීන් සඳහා වෛද්‍යාධාර සහ දීමනා ලබා දීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම.

# සමාජ සේවා නිළධාරී මඟින් රජය මඟින් ලබා දෙනු ලබන දීමනා

- මහජනාධාර රු. 250 සිට, පවුලේ යැපෙන්නන් සංඛ්‍යාව අනුව වෙනස්විය හැකියි.
- ආබාධිත දීමනා රු. 3000 පමණ
- වැඩිහිටි දීමනා රු. 2000 පමණ
- රෝගාධාර දීමනා
- ශිෂ්‍යත්ව වැඩසහන්
- ජනාධිපති අරමුදලින් සැපයෙන ආධාර වැඩසටහන් (සමාජ සේවා නිළධාරී නිර්දේශ කිරීමෙන් පසු)

## ඊට අමතරව,

- රෝගී හිතවතා සහ ඔහුගේ පවුලේ උදවිය රැකබලා ගැනීම සඳහා පවුල සංවර්ධනය කිරීමේ සැලැස්මක් සැකසීම.
- එම ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ ප්‍රගතිය විමසා බැලීමට පසු විපරම් කිරීමක්ද සමාජ සේවා නිළධාරි විසින් සිදු කරනු ලබයි.

## 2. උපදේශන නිළධාරි

- පිළිකා රෝගයෙන් පසුවන ඔබ හිතවතා සහ ඔහු හෝ ඇයගේ පවුලේ උදව්ය සඳහා උපදේශන සේවා, අවශ්‍යතාවය මත ලබා දිය හැකි පුහුණුව ලත් නිළධාරියෙකි.

## රෝගියා සහ පවුලේ සාමාජිකයන්ගේ සුවසහනය සඳහා උපදේශන නිලධාරීන් විසින් ලබාදෙන දායකත්වය

- පිළිකා රෝගියාගේ සහ පවුලේ උදවිගේ මානසික ශක්තිය ගොඩ නැගීම.
- පිළිකා රෝගියාට සහ පවුලේ උදවියට අවශ්‍ය තොරතුරු ලබා දීම.
- පිළිකා රෝගියාව රැකබලා ගැනීම ආශ්‍රිත සත්‍ය ගැටලු හඳුනාගෙන ඒ සඳහා සුදුසු පිලියම් යෙදීම.

- ප්‍රතිකාර කල හැකි සහ සුව කල හැකි පිලිකා රෝගීන් නිසි ප්‍රතිකාර ලබා ගැනීම සඳහා උනන්දු කරවීම සහ පසු විපරම් කිරීම.
- පිළිකාව සමඟ ජීවත් වීම සඳහා රෝගියා සවිමත් කිරීම.
- ඔබගේ රෝගී හිතවතා මියගිය පසුවද පවුලේ සාමාජිකයන්ගේ උපදේශන අවශ්‍යතා සඳහා පිලියම් යෙදීම.

## 3. සමාජ සංවර්ධන නිළධාරි

- ප්‍රාදේශිය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සමාජ සංවිධාන, පිළිකා රෝගීන් රැක බලා ගැනීමේ කටයුතු සඳහාද යොමු කිරීමේ හැකියාව ඇත

## 4. වනිතා කටයුතු සංවර්ධන නිළධාරි

- පිළිකා රෝගයෙන් පීඩා විදින කාන්තාවන් හෝ පවුල් සඳහා මෙම සේවාවන් ප්‍රමුඛතා කාර්යයක් ලෙස සලකා සම්බන්ධීකරණය කරනු ලැබෙයි
- කාන්තාවන් සඳහා සහන ණය
- නිවාස ආධාර
- ස්වයං රැකියා ආධාර

## 5. ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරි

- පිළිකාවෙන් පීඩා විඳින පවුල් වල අවදානම් දරුවන් හඳුනා ගැනීම
- ඔවුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන්
- නිවාස වැඩසටහන් ලබාදීම සම්බන්ධීකරණය

## 6. වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිළධාරි

- වැඩිහිටි අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කිරීම
- වැඩිහිටි සංවිධාන සම්බන්ධීකරණය සිදු කරනු ලැබෙයි.

## 9. විද්‍යා හා තාක්ෂණ නිළධාරි

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ වෘත්තීය සහ තාක්ෂණ පුහුණුව ලබා දෙන විද්‍යා හා තාක්ෂණ පුහුණු මධ්‍යස්ථාන හරහා අවශ්‍ය පුද්ගලයන්ට වෘත්තීය හා තාක්ෂණ පුහුණුව ලබා දීම සම්බන්ධීකරණය සිදු කරනු ලැබෙයි.

## සිද්ධි අධ්‍යයනය 02

සුමනසිරි වයස අවුරුදු 48 ක දෙදරු පියෙකි. ඔහු තම ජීවිකාව ලෙස වඩු කර්මාන්තයේ නිරත වූ අතර තම රැකියාවේ පහසුව සඳහා මෑතකදී ණයක් ලබාගෙන කුඩා ලොරි රථයක් ද මිලදී ගන්නා ලදී. ඔහුගේ බිරිඳ රැකියාවක් නොකළ අතර දරු දෙදෙනා පාසල් වියෙහි පසුවිය. සුමනසිරිගේ රැකියාව පවුලේ එකම ආදායම් මාර්ගය වූ අතර ඔහු රැකියාව අතරතුර පුරුද්දක් ලෙස බුලත්විට සැපීමෙහි නිරතවිය.

මේ අතරතුර මුඛයේ අසාමාන්‍ය වණයක් කාලයක් තිස්සේ පැවතුන බැවින් සහ වේදනාවක් ගෙන දීමට පටන්ගත් බැවින් ඔහු වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවන ලදී.

මෙහිදී අනාවරණය වූයේ ඔහු දරුණු මුඛ පිළිකා රෝගී තත්ත්වයකට ගොදුරුවී ඇති බවයි. ඔහුව ප්‍රතිකාර සඳහා රෝහල්ගත කෙරුණු අතර අදාළ ප්‍රතිකාර කඩිනමින් ආරම්භ කෙරුණි. රෝහල්ගතවීම නිසා පවුලේ එකම ආදායම් මාර්ගය ඇණහිටීමත් ණයබරින් පීඩිතව සිටීමත් ඔහුට විසඳාගත නොහැකි ගැටළුවක් බවට පත්ව තිබුණි.

ඔහුව රැකබලා ගැනීමට සිදුවූයේ ඔහුගේ බිරිඳටයි. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සහ නිවසේ ආර්ථිකය ද කඩා වැටීමෙන් ඇතිවූ සමාජ, ආර්ථික ගැටළු වලින් එම පවුල දැඩිලෙස පීඩාවට පත්වූ අතර මෙම ගැටළු වලට මුහුණ දෙමින් ඔහුව රැකබලාගැනීම සිදුකළහැකි ආකාරය සාකච්ඡා කරන්න.